මිස්ටර් විශ්වජිත් හමුවෙන්න කියලා.."

ඔහු මොහොතක් කල්පනා කරමින් සිටියේ ය. දකුණතින් නළල මත වූ කෙස් පසුපසට කරගනිමින් ඔහු අමන්දි දෙස බලා සිටියේ ය. ඔහුගේ ඇස් වල වූයේ ඇයට තේරුම් ගත නොහැකි බැල්මකි.

"මට සුනෙත් කිව්වා මතකයි.. " ඔහු කිවේ නොසැළකිල්ලෙනි. "ඔයාට චිත්‍ර ඉගෙන ගන්න ඕනෙය කියලනෙ කිව්වෙ.. චිත්‍ර ශිල්පය කියන්නෙ මිස් උත්තරීතර අභ්‍යාසයක්.. ඒක ගැන ඔය තරම් හැල්ලුවට හිතන්න එපා..."

"ඇයි එහෙම කිව්වෙ..?" අමන්දි වහා ඇසුවා ය. ඈ ඔහුගෙන් එවැන්නක් කිසි ලෙසකින්වත් බලාපොරොත්තු නොවූ වාය.

"කොළඹ හතේ නෝනලා හුඟක් වෙලාටව එනවා චිත්‍ර ඉගෙන ගන්න.. ඒ අයට කෑම දිරවගන්න ක්‍රමයක් හැටියට.. මං එහෙම අයට උගන්නන්නෙ නෑ මිස්.. අමනාප වෙන්න එපා"

අමන්දි ගේ මුහුණ කණගාටුවෙන් කලු වෙනු විශ්වජිත් දුටුවේ ය. එහෙත් කිසියම් හේතුවක් නිසා ඔහු සිත තුළ ඇය පිලිබඳ ප්‍රසාදයක් ගොඩ නැගුණේ නැත. "තවත් කරදර කාර ගෑණියෙක්" යන හැඟීම පමණක් ඔහු සිත තුලින් මතුව ආවේ ය.

"චිත්‍ර ශිල්පය ගැන ලොකු භක්තියක් මගේ හිතේ තියෙනවා.. ඔයා ඔහොම කියන එක ගැන මට හරිම කණගාටුයි.." අමන්දි කීවේ සඟවාගත් කෝපයෙනි.

ඔහු සිනාසුණෝ ඈ කී දේ නෑසුණා සේ ය. අනතුරුව සිය ශිෂ්‍යාව වෙත ගොස් යම්කිසි උපදෙසක් දුන්නේ අමන්දි සිටින බව හෝ නොදත්තා සේ ය. සිසුවියි අතින් පින්සලය ගත් ඔහු කැන්වසය මත තීන්ත පහරවල් කීපයක් ඇන්දේ ය. ඈත සිට නොයිවසිල්ලෙන් බලා සිටිනා අමන්දි වෙත ඔහු ආවේ බොහෝ වේලා ගෙන තවත් උපදෙස් කීපයක් ශිෂ්‍යාවට දීමෙන් පසුව ය.

"මිස්ටර් විශ්වජිත් ඔයා හරි පිස්සු මනුස්සයෙ-ක්.. තමන් නන්නාඳුනන කෙනෙක් ගැන ඔහොම නිගමන වලට එන්නෙ කොහොම ද ඔයා..?" අමන්දි ඇසුවා ය.

ඔහු සිනාසුණෝ ය. එය කිසිදු හිතවත් කමක් නැති වියළි සිනාවක් ම විය.

"සමහර දේවල් මට දැනෙනවා... ඒ දැනෙන දේවල් හුඟක් වෙලාවට හරි... චිත්‍ර ශිල්පය කියන්නෙ මහා භක්තියකින් ඉගෙනගන්න ඕනෙ ශිල්පයක්.. ඒකට විශාල කැපවීමක් අවශ්‍යයි.. හොඳ කැපවීමක් තියෙන ගෝලයො දෙතුන්දෙනෙක් හදා ගත්තම මට ඒක ඇති ජීවිතේටම.. කොහොමත් මට මේ දවස් වල වෙලාව නැහැ මිස්.. මට හරිම කණගාටුයි ඔයාට උදව් කරන්න නොහැකි වීම ගැන.."

"මම ඔයාට හොඳ ගෙවීමක් කරන්නම්.." අමන්දි කීවේ අවසාන උත්සාහයක් දරන අටියෙනි.

"කණගාටුයි.." ඔහු කීවේ කෝපයෙනි. ".. මම බිස්නස් එකක් කරන්නෙ නෑ.. කලාව කියන්නෙ මට බිස්නස් එකක් නෙවයි"

00000000000

අමන්දි ගේ මුහුණ කණගාටුවෙන් කලු වෙනු විශ්වජිත් දුටුවේ ය. එහෙත් කිසියම් හේතුවක් නිසා ඔහු සිත තුළ ඇය පිලිබඳ ප්‍රසාදයක් ගොඩ නැගුණේ නැත. "තවත් කරදර කාර ගෑණියෙක්" යන හැඟීම පමණක් ඔහු සිත තුලින් මතුව ආවේ ය.

"චිත්‍ර ශිල්පය ගැන ලොකු භක්තියක් මගේ හිතේ තියෙනවා.. ඔයා ඔහොම කියන එක ගැන මට හරිම කණගාටුයි.." අමන්දි කීවේ සඟවාගත් කෝපයෙනි.

ඔහු සිනාසුණෝ ඈ කී දේ නෑසුණා සේ ය. අනතුරුව සිය ශිෂ්‍යාව වෙත ගොස් යම්කිසි උපදෙසක් දුන්නේ අමන්දි සිටින බව හෝ නොදත්තා සේ ය. සිසුවිය අතින් පින්සලය ගත් ඔහු කැන්වසය මත තීන්ත පහරවල් කීපයක් ඇන්දේ ය. ඈත සිට නොයිවසිල්ලෙන් බලා සිටිනා අමන්දි වෙත ඔහු ආවේ බොහෝ වේලා ගෙන තවත් උපදෙස් කීපයක් ශිෂ්‍යාවට දීමෙන් පසුව ය.

"මිස්ටර් විශ්වජිත් ඔයා හරි පිස්සු මනුස්සයෙක්.. තමන් නන්නාඳුනන කෙනෙක් ගැන ඔහොම නිගමන වලට එන්නෙ කොහොම ද ඔයා..? ඒක හරිම අසාධාරණයිනෙ" අමන්දි කීවා ය.

ඔහු සිනාසුණෝ ය. එය කිසිදු හිතවත් කමක් නැති වියළි සිනාවක් ම විය.

"සමහර දේවල් මට දැනෙනවා... ඒ දැනෙන දේවල් හුඟක් වෙලාවට හරි... චිත්‍ර ශිල්පය කියන්නෙ මහා භක්තියකින් ඉගෙනගන්න ඕනෙ ශිල්පයක්.. ඒකට විශාල කැපවීමක් අවශ්‍යයි..

*"චිත්‍ර ශිල්පය කියන්නෙ මිස් උත්තරීතර අභ්‍යාසයක්.. ඒක ගැන ඔය තරම් හැල්ලුවට හිතන්න එපා..."*



හොඳ කැපවීමක් තියෙන ගෝලයො දෙතුන්දෙනෙක් හදා ගත්තම මට ඒක ඇති ජීවිතේටම.. කොහොමත් මට මේ දවස් වල වෙලාව නැහැ මිස්.. මට හරිම කණගාටුයි ඔයාට උදව් කරන්න නොහැකි වීම ගැන.."

"මම ඔයාට හොඳ ගෙවීමක් කරන්නම්.." අමන්දි කීවේ අවසාන උත්සාහයක් දරන අටියෙනි.

"කණගාටුයි.." ඔහු කීවේ කෝපයෙනි. ".. මම බිස්නස් එකක් කරන්නෙ නෑ.. කලාව කියන්නෙ මට බිස්නස් එකක් නෙවයි"

000000

අමන්දි විශ්වජිත් ගේ කලාගාරයෙන් පිටව ආවේ කෝපයෙනි. ඒ බව ඔහුට දැනුණ නමුදු ඒ පිළිබඳව සිතන්නට හෝ කරදර වන්නට හෝ ඔහුට අවශ්‍ය නොවී ය.

උන්හිටි ගමන් පහළ වන චිත්‍ර ඇඳීමේ ආසාවෙ-න් පෙළෙන කාන්තාවන් ඔහුට අනන්තවත් හමු වී ඇත. මුල් යුගයේ දී ඔහු අනුකම්පාව නිසා ම ඔවුනතරින් බොහෝ දෙනකුට අත දෙන්නට තැත් කළේ ය. එනමුදු චිත්‍ර කලාව පිළිබඳව සැබෑ අවබෝධයක් හෝ කැපවීමක් හෝ පෙන්නුම් නොකළ බොහෝ දෙනා අතරමඟ නතර වූයේ විශ්වජිත් ගේ සිතේ කළකිරීමක් පමණක් ඉතිරි කරමින් ය. යන්තමින් හෝ එබඳු චරිතයක් හමු වූ විට " හඳුනාගත් විට හැකි ඉක්මනින් ඔවුන් වෙතින් ඉවත් වන්නට ඔහු අදිටන් කරගෙන සිටියේ ය.

අමන්දි කොතැනක දී හෝ හමු වූ බවක් ඔහුගේ සිතට දැනෙයි. ඒ කොතැනදී දැයි ඔහුට නිච්චියක් නැත. අමන්දි ගේ ඉල්ලීම ප්‍රතික්ෂෙප කිරීම තවත් එක් සිදුවීමක් පමණක් ලෙස සිතා ඔහු සිත හදා ගන්නට තැත් කළේ ය.

අලුත්ම කැන්වසයක් ඊසලය මත සවි කර විශ්වජිත් තමා අඳින්නට කල්පනා කරමින් සිටි අලුත්ම සිත්තම අඳින්නට පටන් ගත්තේ ය. පින්සල් පහර කීපයක් ඒ මේ අතට ඇන්ද විශ්වජිත් සිත්තම ඇඳීම නවතා දැමුවේ ය. තමා අසාමාන්‍ය ලෙස කැළඹීමකට පත්ව සිටින බවක් ඔහුට දැනෙයි. ඒ මන්දැයි සිතා ගන්නට ඔහුට නොහැකි විය.

සවස පාඩම ගන්නට ශාමිලා එන තෙක්ම ඔහු ඔහුගේ සිතේ වූ නොසන්සුන් බව අඩු වී නොතිබුණි.

"සර් ලොකු කල්පනාවක වගේ.." ශාමිලා සිය ගමන් මල්ල බිම දමන අතර කීවා ය. ඔහු මළානික සිනා-වක් පෑවේ ය. වෙනදාට ගුරුවරයා තුළ පැවති උද්‍යෝගය අද ඇයට ඔහු වෙතින් දිස් නොවුණි.

''සර් අසනීපෙන් ද.?" ශාමිලා ඔහු අබියසට එන අතර ඇසුවා ය. ඔහුගේ නළල මත අතක් තබා බලන්නට හැකි නම්.! අකීකරු සිත නොදැමුණ ආසා-වකින් වැසී යයි. එයට ඉඩ දීමේ හැකියාවක් නැත. ඔහු පූජනීය මිනිසෙකි. ශාමිලා බිම බලා ගත්තා ය.

"නැහැ.. මට අසනීපයක් නැහැ.." ඔහු වාඩි වී සිටි බක්කි පුටුවෙන් නැගී සිටින අතර කිවේ ය. තමාට අඩි දෙකක් නුදුරින් සිටගෙන සිටින යුවතිය ගේ හිස මත සිය සුරත තැබූ ඔහු සිනාසුණෝ ය. "අපි පාඩම පටන් ගමු.."

00000000000000000000

අමන්දි නිවසට එන විට නිමන්ත පැමිණ සිටියේ නැත. ඇඳුම් මාරු කරන්නටත් පෙර ම සිය කලාගාරයට ඇතුල් වූ අමන්දි ඊසලය මත රඳවා තිබූ කැන්වසය ගලවා විසිකර දැමුවා ය. තීන්ත බෝතල සියල්ල ජනේලයෙන් ඉවතට විසි කළා ය. ආවේගය නිසාම ඇය හැඬුවාය. ඉකි ගසමින් හැඬුවා ය. කාමරයේ බිම වැටී ඇති තරම් හැඬුවා ය. ගත පුරා නැඟ එන වේදනාව නොතකා පැය ගණනක් හඬා වැටුණා ය. වේදනාව දරා ගත නොහැකිව කෙඳිරි ගෑවා ය. නැගිට ගොස් බෙහෙත් පෙත්තක් කටේ දමාගන්නට හෝ නොවෙහෙසුණා ය.

නිමන්ත නිවසට එන විට අමන්දි සිටියේ සිහිසුන්ව බිම වැතිර ගත් ගමන් ම ය.

00000000000

චතුරි මිලින්ද සමඟින් රෝහලට එන විට නිමන්ත සිටියේ අවුල්ව ගිය සිතිණි. රාත්‍රිය පුරා නිදි වැරීම නිසා ශාරීරික තෙහෙට්ටුව ද ඔහුට දැඩිව දැනුණි. ඔහු බොහෝ සේ කැළඹී සිටියේ ය. එනිසාම මේ දෙනොගේ පැමිණීම ඔහුගේ සිතට මහත් සැනසුමක් ගෙන දුන්නේ ය.

"අක්කිට කොහොම ද..?" චතුරිකා වහා ඇසුවා ය.

"සිහිය නෑ.. පේන් කිලර්ස් දීලා.." නිමන්ත කීවේ ය. මිලින්ද ඔහුගේ උරහිස මත තම අත තැබුවේ ය. " හිත කලබල කරගන්න එපා.."

"කලබල වෙන්න එපා.. මං බලන්නං.." ඔහු චතුරි දෙස බලා කිවේ ය.

"මාත් එන්නං.." චතුරි මිලින්ද හා සමඟම කාමරයට ඇතුල් විය. නිමන්ත ඔවුන් පසු පසින් ගියේ සිහිනයෙන් ඇවිදින්නා සේ ය. අමන්දිගේ ඇඳ පත කියවා බැලූ මිලින්ද ඉවත්ව ගියේ වෛද්‍ය වරුන් හමුවීම සඳහා ය.

"අම්මලාට කිව්ව ද..?" නිමන්ත ඇසුවේ ය.







"නැහැ අයියා.. මේ හැටි ඒ අයගෙ හිත් වලට කරදර දාන්නෙ මොකටද කියලා හිතලා මං කිව්වෙ නැහැ.. අපි අද තත්වය බලලා පස්සෙ කියමු.." චතුරි කීවේ සිය සොහොයුරියගේ පොරවනය සකස් කරන අතර ය.

"මොනා වුණා ද මං දන්නෙ නෑ.. මං එනකොට සිහිය නැතිව වැටිලා හිටියා.. පහුගිය දවස් වල ආසාවෙන් ඇඳ ඇඳ හිටපු චිත්‍රත් විසිකරලා දාලා තිබුණා.." නිමන්ත කීවේ අසරණ ලෙස ය.

"දවල් එයා කොහෙද ගියේ..?"

"දන්නැහැ.. එයා දැන් ටික දවසක ඉඳලා යන එන තැන් මා එක්ක කියන්නෙ නැහැ.. යන එන තැන් නෙවෙයි.. කො-හොමත් එයා දැන් මා එක්ක වැඩි කතා බහක් නැහැ.."

අමන්දි එසේ හැසිරෙන්නේ ඇයි දැයි නිමන්තගෙන් අසන්නට චතුරි නොසිතුවා ය. මතුපිටින් නොපෙන්වා සිටින්නට වැර දැරුවද අමන්දි මුහුණ දෙමින් සිටින මානසික ව්‍යසනය චතුරි තේරුම් ගෙන සිටියා ය. සිය සොයුරිය මේ සටනට මුහුණ දෙන අතරදී ඈ ඇගේ හැසිරීම් හෝ ඈ අතින් වන අතපසු වීම් හෝ ගැන තැකීමක් කිරීම නොකළ යුතු දෙයකැයි ඇය සිතුවා ය.

"අයියා කල්පනාවෙන් වැඩ කරන්න ඕනෙ මේ දවස් වල.." චතුරි කීවා ය.

**මතු සම්බන්ධයි**